ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1992 අංක 10 දරන
# ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: 1.20 ශ.                                         තැපැල් ගාස්තුව: රු. 1.00 ශ.

# 1992 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 06 වන දින.]

එල්. ඩී.—ඕ 99/90

**1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 1992 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 2 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනතේ 5 වන වගන්තියේ එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ, "මධ්‍යම කාල හා දීර්ඝ කාල ණය" යන වචන වෙනුවට "ණය" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ—

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "කවර වූ හෝ ව්‍යවසායකට ණය සහ අත්තිකාරම් දීම" යන වචන වෙනුවට, "කවර වූ හෝ ව්‍යවසායකට ඇපයක් ඇතිව හෝ නැතිව ණය සහ අත්තිකාරම් දීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්—

"(ඔඔ) භාරගැනීම යෝග්‍ය සේ පෙනෙන යම් භාරයක් භාරගෙන ක්‍රියාත්මක කිරීම ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (ඇ) ඡේදයේ "අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම" යන වචන වෙනුවට, "අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා එහි නිලධරයන්ගේ සහ සේවක යන්ගේ ප්‍රතිලාභය පිණිස විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ඒ අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අධ්‍යක්ෂ මණ්ඩලය.

8. (1) නම් කරනු ලැබූ සහ තෝරා පත්කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයන්ගෙන් සමන්විත සාමාජික යන් පස් දෙනෙකුට නොඅඩු වූ ද සාමාජිකයන් දහ දෙනෙකු නොඉක්මවන්නා වූ ද අධ්‍යක්ෂ මණ්ඩල යක් බැංකුවෙහි විය යුතු ය. එම අධ්‍යක්ෂවරයන්

අවස්ථාවෝචිත පරිදි 8අ හෝ 8ආ වගන්ති යටතේ නම් කරන ලද හෝ තෝරා පත්කර ගන්නා ලද තැනැත්තන් විය යුතු ය.

(2) සාමාන්‍යාධිකාරිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය දීමේ අයිතිවාසිකම නොමැතිව, නිල බලයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ, 8ආ සහ 8ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

6. 8 වන වගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති, ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ, 8ආ සහ 8ඇ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

" නම්කළ අධ්‍යක්ෂවරු.

8අ. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් අමාත්‍යවරයා විසින් පහත සඳහන් තැනැත්තන් නම් කළ යුතු ය :—

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ මහ බැංකුව හෝ දෙපාර්ශවයම එක්ව හෝ බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට විසිපහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරන්නා වූ අවස්ථාවක, එක් තැනැත්තකු ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු වන පරිදි තැනැත්තන් තුන්දෙනෙක් ;

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ මහ බැංකුව හෝ දෙපාර්ශවයම එක්ව හෝ බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට විසි පහකට අඩු ප්‍රමාණයක් දරන්නා වූ අවස්ථාවක, එක් තැනැත්තකු ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු වන පරිදි තැනැත්තන් දෙදෙනෙක්.

මේ උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු, මෙහි මින්මතු " නම් කළ අධ්‍යක්ෂ " යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) නම් කළ අධ්‍යක්ෂවරයකු අවුරුදු හතරක කාල සීමාවක් ධුරය දැරිය යුතුය :

එසේ වුවද (1) වන උපවගන්තිය යටතේ එම තැනැත්තන් අධ්‍යක්ෂවරයන් ලෙස නම් කරනු ලැබීමෙන් පසු ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ මහ බැංකුව හෝ දෙපාර්ශවයම එක්ව හෝ දරන ලද කොටස්වල ප්‍රතිශතය, තෝරා පත් කළ අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව වැඩි කිරීමක් අවශ්‍ය වන ප්‍රමාණයකට අඩු වුවහොත් අවස්ථාවෝචිත පරිදි නම් කළ අධ්‍යක්ෂවරයන් එක් කෙනෙකු ගෙන් හෝ දෙදෙනෙකුගෙන් ධුරයෙන් ඉල්ලා අස් වන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිය යුතු ය. තවද, අවස්ථාවෝචිත පරිදි ඒ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් ධුරයෙන් ඉල්ලා අස්වීම පැහැර හැරියහොත් අමාත්‍යවරයා විසින් ඒ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් ධුර යෙන් ඉවත් කළ යුතු ය.

(3) නම් කළ අධ්‍යක්ෂවරයකු, අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා, ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) නම් කළ අධ්‍යක්ෂවරයකු විසින් තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) නම් කළ අධ්‍යක්ෂවරයකුට, රෝගාතුර වීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ හේතුවෙන්, තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථා වක, ඔහුගේ විකල්ප අධ්‍යක්ෂවරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලදී ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් නම් කළ හැකි අතර එසේ නම් කරනු ලැබූ තැනැත් තාට ඒ රැස්වීම්වලදී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

(6) නම් කළ අධ්‍යක්ෂවරයකු (2) වන උප වගන්තියේ අතුරු වගන්තිය යටතේ ඉල්ලා අස් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හැර මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබී මෙන් ධුරය හිස් කළ විට, ඒ පුරප්පාඩුව සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු නම් කළ යුතු ය. එසේ නම් කරන ලද තැනැත්තා අනුප්‍රාප්ත වන්නේ යම් අධ්‍යක්ෂවරයකු වෙනුවෙන් ද ඒ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ඔහු ධුරය දැරිය යුතු ය.

8ආ. (1) මණ්ඩලයේ තෝරා පත් කර ගන්නා අධ්‍යක්ෂවරයන් බැංකුවේ කොටස්කරුවන් (ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහ මහ බැංකුව හැර) විසින් බැංකුවේ කොටස්කරුවන්ගේ සෑම වාර්ෂික

තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරු.

මහා සභා රැස්වීමකදීම, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මහ බැංකුව හැර අනෙකුත් තැනැත්තන් විසින් දරනු ලබන බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සෑම සියයට දහයකටම එක් සාමාජිකයකු බැගින් වන පදනම මත තෝරා පත් කර ගත යුතු අතර කෙසේ වුවද, එසේ තෝරා පත්කර ගන්නා අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව, 8 වන වගන්තිය යටතේ සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව සහ 8අ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නම් කළ හැකි අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව අතර වෙනස නොඉක්මවිය යුතු ය.

**නිදර්ශනය**

(ආණ්ඩුව සහ මහ බැංකුව හැර) කොටස්කරුවන්ට අයත්, බැංකුවේ නිකුත් කළ මුළු කොටස් ප්‍රාග්ධනයේ ප්‍රතිශතය, සියයට හතළිහක් නම්, ඒ කොටස්කරුවන්ට සාමාජිකයන් හතර දෙනෙකු තෝරා පත්කර ගැනීමට හිමිකම් ඇත්තේ ය.

(2) (ශ්‍රී ලංකා ආණ්ඩුව හා මහ බැංකුව හැර) බැංකුවේ කොටස්කරුවන් විසින් කොටස්කරුවන් පස් දෙනකුගේ හෝ ඊට වැඩි සංඛ්‍යාවකගේ ඉල්ලීම පිට සභාපතිවරයා විසින් කැඳවනු ලබන ඒ කොටස්කරුවන්ගේ රැස්වීමක දී තෝරාපත් කර ගත් අධ්‍යක්ෂවරයකු ධුර යෙන් ඉවත් කොට ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් අධ්‍යක්ෂවරයකු තෝරා පත්කර ගනු ලැබිය හැකි ය.

(3) තෝරා පත්කර ගත් අධ්‍යක්ෂවරයකු විසින්, තත් කාර්යය සඳහා සභාපතිවරයා අමතා යවන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) තෝරා පත්කර ගත් අධ්‍යක්ෂවරයකු රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ හේතුවෙන් ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහුගේ විකල්ප අධ්‍යක්ෂවරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලදී ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු, අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ඒ අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තාට, ඒ රැස්වීම්වලදී ඡන්දය දීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

(5) තෝරා පත්කර ගත් අධ්‍යක්ෂවරයකු මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ධුරය හිස් වුවහොත් එවිට ද, තෝරා පත්කර ගන්නා අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ

මහ බැංකුව හැර) කොටස්කරුවන් දරන කොටස් ප්‍රමාණයෙහි වැඩිවීමක ප්‍රතිඵලයක් වශයෙන් වැඩි කරනු ලැබුවහොත් එවිටද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඒ පුරප්පාඩුව සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි අතර එසේ පත් කරනු ලැබූ තැනැත්තා, ඒ පුරප්පාඩුව ඇතිවීමෙන් පසුව පැවැත්වෙන බැංකුවේ පළමු වාර්ෂික මහ සභා රැස්වීම තෙක් ධුරය දැරිය යුතු ය. ඒ තැනැත්තා ඒ රැස්වීමේදී අධ්‍යක්ෂවරයකු ලෙස නැවත තෝරා පත් කර ගනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(6) තෝරා පත්කර ගත් අධ්‍යක්ෂවරයන්ගෙන් තුනෙන් එකක් හෝ තෝරාපත්කර ගත් අධ්‍යක්ෂවරයන්ගේ සංඛ්‍යාව තුනක් හෝ තුනෙහි ගුණිතයක් හෝ නොවේ නම් ඒ සංඛ්‍යාවෙන් තුනෙන් එකකට ආසන්නතම සංඛ්‍යාව හෝ බැංකුවේ කොටස්කරුවන්ගේ සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දීම, ධුරයෙන් ඉවත් විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඒ පුරප්පාඩුව හෝ පුරප්පාඩු නොපිරවීමට, (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මහ බැංකුව හැර) කොටස්කරුවන් විසින් ප්‍රකාශිතව යෝජනා සම්මතයක් කර ඇත් නම් හෝ අවස්ථාවෝචිත පරිදි, ධුරයෙන් ඉවත් වන ඒ තෝරාපත් කර ගත් අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් නැවත තෝරා පත්කර ගැනීම සඳහා වූ යෝජනාවක් ඒ අනෙකුත් කොටස්කරුවන්ට ඒ රැස්වීමේ දී ඉදිරිපත් කරනු ලැබ පරාජයට පත්වී ඇත්නම් හෝ ඒ පුරප්පාඩුව පිරවීම අවශ්‍ය වීමට තරම් ඒ රැස්වීමට පෙරාතුවම දින යේදී (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මහ බැංකුව හැර) කොටස්කරුවන් දරන කොටස් ප්‍රමාණය ප්‍රමාණවත් නොවේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි ඒ පුරප්පාඩුව හෝ පුරප්පාඩු පිරවීම සඳහා අලුත් සාමාජිකයන් තෝරා පත්කර ගත යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් විය යුත්තේ ඒ වගන්තියේ සඳහන් වාර්ෂික මහා සභා රැස්වීමේ දිනය වන විට, වඩාම දීර්ඝ කාලයක් ධුරය දරා තිබෙන අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් වන නමුත් ඒ දිනය වන විට සමාන කාලසීමාවක් සේවය කර තිබෙන අධ්‍යක්ෂවරයන් අතරෙහි එසේ ධුරයෙන් ඉවත් වීමක් සිදුවිය යුතු අවස්ථාවක ධුරයෙන් ඉවත් විය යුතු අධ්‍යක්ෂවරයා නිශ්චය කිරීම රැස්වීමේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් කළ යුතු ය.

(8) ධුරයෙන් ඉවත්වන තෝරා පත්කර ගත් අධ්‍යක්ෂවරයකු නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුසු විය යුතු ය.

ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය.

8ඇ. (1) මේ වගන්තිය බලාත්මක වන දින යෙන් පසුව පැවැත්වෙන බැංකුවේ කොටස්කරු වන්ගේ පළමුවන වාර්ෂික මහා සභා රැස්වීමේ දී, (මේ වගන්තියේ "ප්‍රථම මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක්, 8අ වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 8ආ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන ආකාරයට සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රථම මණ්ඩලයේ තෝරා පත්කර ගත් සාමාජිකයන්, (1) වන උපවගන්තියේ සඳහන් බැංකුවේ කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසුව ඊළඟට පැවැත්වෙන බැංකුවේ කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමේ දිනය තෙක් ධුර දැරිය යුතු ය.

(3) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුර හිස් කිරීම සහ මණ්ඩලයේ සාමාජිකයකු තාවකාලිකව නොපැමිණ සිටීම සම්බන්ධයෙන් 8අ සහ 8ආ වගන්තිවල විධිවිධාන, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ප්‍රථම මණ්ඩලයේ සාමා ජිකයන් කෙරෙහි හා ඔවුන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ "අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි" යන වචන වෙනුවට "වරින් වර, බැංකුවේ කොටස් හිමියන්ගේ යම් වාර්ෂික මහා සභා රැස්වීම කදී, ඒ කොටස් හිමියන් විසින් තීරණය කරනු ලබන පරිදි" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරී මෙන් :—

"(1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන් අතුරෙන් සභා පතිවරයෙකු තෝරා පත් කර ගත යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "පත් කිරීමේ දිනයෙන්" යන වචන වෙනුවට "තෝරා පත් කර ගත් දිනයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "වෙනත් තැනැත් තකු පත් කළ යුතු ය" යන වචන වෙනුවට "වෙනත් තැනැත්තකු තෝරා පත්කර ගත යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ " නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය." යන වචන වෙනුවට " නැවත තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සකු විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (3) වන උපවගන්තියේ " සාමාන්‍යාධිකාරිවරයා හෝ වැඩබලන සාමාන්‍යාධිකාරිවරයා සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රය කට අත්සන් නොතැබිය යුතු අතර, තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ සියලුදෙනාම" යන වචන වෙනුවට " සාමාන්‍යාධිකාරි වරයා හෝ වැඩබලන සාමාන්‍යාධිකාරිවරයා සහ එක් අධ්‍යක්ෂවර යකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට අත්සන් නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ දෙදෙනාම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" බැංකුවේ ප්‍රාග්ධනය.

21. (1) බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය රුපියල් මිලියන දෙදහසක් විය යුතු අතර එය රුපියල් දහය බැගින් වූ කොටස් මිලියන දෙසියයකට බෙදනු ලැබිය යුතු ය.

(2) 22 වන වගන්තිය යටතේ වෙන් කරනු නොලැබ ඇත්තා වූ (1) වන උපවගන්තියේ සඳහන් කොටස්වලින් යම් කොටස් ප්‍රමාණයක් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් අවස්ථාවකදී හෝ අවස්ථාවලදී යම් මුදලකට හෝ මුදල් වලට සහ යම් ආකාරයකින් දායකවීම සඳහා බැංකුව විසින් මහජනයා වෙත ඉදිරිපත් කළ හැකි ය. තවද, ඒ කොටස් වෙනුවෙන් ගෙවීම කරනු ලැබූ විට 22 වන වගන්තියේ 2(ආ) උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ කොටස් පිළිවෙලින් වූ ගැණුම්කරුවන් වෙත වෙන් කර දිය යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (2) (අ) බැංකුවෙහි ඇති තමන්ගේ සියලු කොටස් හෝ ඉන් කිසිවක් විකිණීමට ;

(ආ) බැංකුවෙහි ඇති තමන්ගේ සියලු කොටස් හෝ ඉන් කිසිවක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, බැංකුව විසින් නිකුත් කරන ලද බැඳුම්කරවලට, ණය පත්‍ර වලට හෝ වරණීය කොටස්වලට අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව පරිවර්තනය කිරීමට

(1) වන උපවගන්තියෙහි සඳහන් කොටස්කරුවන්ට බලය ඇත්තේ ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2අ) (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් කොටස්කරුවන්ගෙන් යම් කොටස්කරුවකු විසින් බැංකුව වෙත නිකුත් කරන ලද යම් පොරොන්දු නෝට්ටුවක්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවලංගු කළ හැකි ය. තවද, එසේ අවලංගු කරනු ලැබූ විට, අවලංගු කරනු ලැබූ පොරොන්දු නෝට්ටුවල වටිනාකමෙයි ප්‍රමාණයට බැංකුවෙහි නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය අඩු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2ආ) (අ) බැංකුවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩි ප්‍රමාණයක් යම් සමාගමක්, සංස්ථාගත මණ්ඩලයක් හෝ පුද්ගලයකුට අයත්වීම යම් වෙන්කර දීමක හෝ ලියාපදිංචි කිරීමක හෝ ප්‍රතිඵලය වන්නේ නම්, ඒ සමාගමෙහි, සංස්ථාගත මණ්ඩලයෙහි හෝ පුද්ගලයාගේ නාමයෙන් ;

(ආ) ඒ වෙන්කර දීමෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ඒ සමාගම සහ (i) වන, (ii) වන, (iii) සහ (iv) වන අනුඡේදවල සඳහන් තැනැත්තන්ගෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි දෙනකු එකතුව බැංකුවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩියෙන් අයත් කර ගැනීම ප්‍රතිඵලය වන්නේ නම්, සමාගමක සහ පහත දැක්වෙන ඒවායින් යම් එකක හෝ වැඩි ගණනක—

(i) එහි යම් පාලිත සමාගමක ;

(ii) එහි පාලක සමාගමක ;

(iii) එහි පාලක සමාගමක පාලිත සමාගමක ; හෝ

(iv) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගමක හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක

සැලකිය යුතු සම්බන්ධතා
වක් ඇති සමාගමක
නාමයෙන් ;

(ඇ) ඒ වෙන්කර දීමෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ඒ පුද්ගලයා සහ (i) වන, (ii) වන, (iii) වන, (iv) වන, (v) වන, (vi) වන සහ (vii) වන අනුඡේදවල සඳහන් තැනැත්තන්ගෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩිදෙනකු බැංකුවේ මුළු නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩි යෙන් අත් කර ගැනීම ප්‍රතිඵලය වන්නේ නම් පුද්ගලයකුගේ සහ පහත දැක්වෙන ඒවායින් යම් එකක හෝ වැඩි ගණනක එනම්:—

(i) තමාගේ කිට්ටු ඥාතීන්ගේ නාමයෙන් ;

(ii) තමාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ හෝ තමාගේ කිට්ටු ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක නාමයෙන් ;

(iii) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක පාලිත සමාගමක නාමයෙන් ;

(iv) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක පාලක සමාගමක නාමයෙන් ;

(v) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක පාලක සමාගමක පාලිත සමාගමක නාමයෙන් ;

(vi) (ii) වන අනුඡේදයෙහි සඳහන් සමාගමක හෝ එහි පාලිත සමාගමක හෝ එහි පාලක සමාගමක හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක නාමයෙන් ; හෝ

(vii) ඒ පුද්ගලයාට හෝ ඒ පුද්ගලයාගේ කිට්ටු ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක් නොවන සංස්ථාගත මණ්ඩලයක නාමයෙන් ;

බැංකුව විසින්, 21 වන වගන්තියේ (2) උපවගන්තිය යටතේ කොටස් කිසිවක් වෙන්කර දීම හෝ කොටස් කිසිවක් ලියාපදිංචි කිරීම හෝ නොකළ යුතු ය.

මේ උපවගන්තියේ අර්ථානුකූලව සමාගමකට හෝ පුද්ගලයකුට යම් සමාගමක හෝ සමාගමක් නොවන සංස්ථාගත මණ්ඩලයක සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තේ යයි සලකනු ලැබිය යුත්තේ, අවස්ථාවෝචිත පරිදි එම සමාගමේ හෝ සංස්ථාගත මණ්ඩලයේ කොටස්වලින් පනස් එකකට වැඩි කොටස් ප්‍රමාණයක් ඉහත සඳහන් සමාගමට හෝ පුද්ගලයාට අයත් අවස්ථාවක දී ය.

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "මේ වගන්තියේ හෝ 57 වන වගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "21 වන වගන්තියේ හෝ මේ වගන්තියේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(5) (2ආ) උපවගන්තියේ කාර්ය සඳහා—

"කිට්ටු ඥාතියා" යන්නෙන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට ඒ තැනැත්තාගේ දෙමාපියකු අඹු/සැමි හෝ දරුවකු හෝ ඒ තැනැත්තාගේ දරුවකුගේ අඹු/සැමි අදහස් වේ;

"පාලිත සමාගම" යන්නෙහි 1988 අංක 30 දරන බැංකු පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද බැංකුව සහ යම් බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් අතර අන්‍යොන්‍ය වශයෙන් එකඟ වන යම් නියමයන් සහ කොන්දේසි මත බැංකුව විසින් ඒ බලපත්‍රලත් වාණිජ බැංකුවෙන් කලින් කල මුදල් ප්‍රමාණයන් ණයට ගනු ලැබිය හැකිය.";

(2) මේ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"මේ වගන්තියේ කාර්ය සඳහා "බලපත්‍රලත් වාණිජ බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් අදහස් වේ."; සහ

(3) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"මහ බැංකුවෙන් සහ බලපත්‍ර ලත් වාණිජ බැංකුවලින් තාවකාලික ලෙස ණය ගැනීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය ඉවත් කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස ඉවත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 66අ සහ 66ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 66අ සහ 66ආ වගන්ති වශයෙන් බලසහිත විය යුතුය :—

"බැංකුව සාක්ෂි ආඥාපනතේ අර්ථානුකූලව බැංකුවක් ලෙස සැලකිය යුතු බව.

66අ. බැංකුව විසින්, ඉල්ලූවිට තැන්පතු භාරගනු නොලැබුවද බැංකුව සාක්ෂි ආඥාපනතේ VI වන පරිච්ඡේදයේ අර්ථානුකූලව බැංකුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ පරිච්ඡේදයේ විධි විධාන බැංකුවට සහ බැංකුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

වාර්ෂික මහා සභා රැස්වීම.

**66ආ.** එක් එක් මුදල් වර්ෂයේ අවසානයට පසු මාස නවයක් ඇතුළත බැංකුවේ කොටස්කරුවන්ගේ මහා සභා රැස්වීමක් පවත්වනු ලැබිය යුතු අතර, එම රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව සහ ගිණුම් සැලකිල්ලට භාජනය කොට ලාභාංශ ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් තීරණ ගත යුතු ය. වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ ආකාරය සහ ඒ රැස්වීමේදී කටයුතු කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය නියම කරනු ලැබූ පරිදි විය යුතු ය. වාර්ෂික මහා සභා රැස්වීමේ දිනයට ඉහතින්ම වූ දිනයෙහි බැංකුවේ කොටස් හිමිකම් අනුව සෑම වාර්ෂික මහා සභා රැස්වීමකදීම අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයන් තෝරා පත්කර ගැනීම කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය ඉවත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයේ "අ" ආකෘතියේ "................. ක් වූ ......... මස ......... වන දින" යන වචන සිට "කොළඹ දී දෙන ලදී." යන වචන තෙක් වූ සියලු වචන අත්හැරීමෙන් ; සහ

(2) ඒ උපලේඛනයේ "ආ" ආකෘතියේ "......... ක් වූ ......... මස ......... වන දින", යන වචන සිට "කොළඹ දී දෙන ලදී." යන වචන තෙක් වූ සියලු වචන අත් හැරීමෙන්.

ආරක්ෂා කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණද මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි ධුර දරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් මේ පනත ආරම්භ වීමේ දිනයට පසුව පවත්වනු ලබන බැංකුවේ කොටස්කරුවන්ගේ පළමු වන වාර්ෂික මහා සභා රැස්වීමේ දින සිට ධුර දැරීම අවසන් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් මුළු වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.